පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2016/17 (April 2017)
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016/17 (අප්‍රේල් 2017)

භාෂණ සහ සංවාද සිංහල ව්‍යවහාරය

# Colloquial and Communicative Sinhala - SUPE 004

**කාලය පැය දෙක යි (02).**

පහත දැක්වෙන ප්‍රශ්නවලින් **හතරක්** (04) සඳහා පිළිතුරු සපයන්න.

මෙහි ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව **හතකි** (07). නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.

---

1. මිතුරන් දෙදෙනෙකු අතර ඇති වූ කතාබහක් පහත දැක්වේ. එහි දී ඇති පිළිතුරුවලට ගැළපෙන ප්‍රශ්න අනුමාන කර ලියන්න.

රවී: ……………………………………………………………..?

ගීතා: අපිට පූසෙක් නෑ. බල්ලෙක් ඉන්නෙ.

රවී: ……………………………………………………………..?

ගීතා: නෑ. ඌ ලොකුයි. ……………………………………………..?

රවී: ඔව්. මටත් එකෙක් ඉන්නව.

ගීතා: ……………………………………………………………..?

රවී: යාලුවෙක්ගෙ ගෙදරින් ගෙනාවෙ.

ගීතා: ……………………………………………………………..?

රවී: සුදු පාටයි. ……………………………………………?

ගීතා: දුඹුරු පාටයි.

රවී: ……………………………………………………………..?

ගීතා: ටොමී. ……………………………………………………?

රවී: වයිටා. ………………………………………………………?

ගීතා: ඌ ඉන්නෙ කූඩුවෙ…………………………………………………?

රවී: නෑ. අපේ වයිට ලිහල ඉන්නෙ.

2. (අ) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දැනට අපේ පදිංචිය නුවර. නමුත් අපි කලිං හිටියෙ ගම්පහ. ගම්පහ අපේ හුඟක් යාලුවො හෙම ඉන්නවා. අපි නුවර පදිංචියට ආවෙ ගිය අවුරුද්දෙ. අපේ තාත්තා ආණ්ඩුවෙ රස්සාවක් කරන කෙනෙක්. තාත්තා වැඩ කරන්නෙ ආණ්ඩුවෙ ඩිස්පැන්සරියක. තාත්තාට ගිය අවුරුද්දෙ මාරුවීමක් ලැබුණා නුවරට. ඉතිං අපි ඔක්කෝටම නුවර එන්ඩ උනා. අපිට ආණ්ඩුවෙ ගේකුත් ලැබුණා. ඒ ගේ තියෙන්නෙ පුංචි ඉඩමක. ඒ ඉඩමෙ අපිට එලෝලු පලතුරු හෙම හිටවාගන්නත් පුලුවන්. තාත්තා හැමදම උදේ ඩිස්පැන්සරියට යනවා. මායි මල්ලියි සෙනසුරාදයි ඉරිදයි ඇර අනිත් දවස්වල ඉස්කෝලෙ යනවා. මගෙ තව පුංචි මල්ලි කෙනෙක් ඉන්නවා. ඒ මල්ලි තවම ඉස්කෝලෙ යන්නෙ නෑ. අපි ඉස්කෝලෙ ගියාම ගෙදර ඉන්නෙ අම්මායි පුංචි මල්ලියි විතරයි. අම්මා රස්සාවක් කරන්නෙ නෑ. ගෙදර තියෙන වැඩ ඔක්කොම කරන්නෙ අම්මා. ඩිස්පැන්සරියෙ වැඩ කරලා, තාත්තා ගෙදර එන්නෙ හවස. ඉස්කෝලෙ ඉදලා ආවාම මට හුඟක් වැඩ තියෙනවා, පොත්වල. දැං මං ඉගන ගන්නෙ දහවෙනි පංතියෙ. මේ ඉස්කෝලෙ මට අලුත්. මං කලිං උන්නු ඉස්කෝලෙට වැඩියෙ මෙහෙ වැඩ වැඩියි. වැඩ හුඟක් අමාරුයි. ඒ නිසා මට බොහොම මහන්සි වෙන්ඩ වෙනවා. මගෙ බලාපොරොත්තුව විබාගෙන් පළවෙනියාට එන්ඩයි.

i. මෙම ඡේදයෙන් කියවෙන පවුලේ අය නුවර පදිංචියට ආවේ කොහේ සිටද?

ii. ඔවුන් පදිංචිය වෙනස් කළේ ඇයි?

iii. මෙම පවුලේ ඉන්නා සාමාජිකයන් කවුදැයි නම් කරන්න.

iv. මෙම පවුලේ පියාගේ රැකියාව කුමක්ද?

v. අලුත් පාසලේ වැඩ ගැන කියා ඇත්තේ කුමක්ද?

(ආ) මෙම ඡේදයෙන් ක්‍රියා පද පහක් සොයා ඒවායේ වර්තමාන හා අතීත රූප ලියා දක්වන්න.

3.



(අ) ඉහත දැක්වෙන චිත්‍රයේ අදහස තේරුම් ගෙන ඒ ගැන වාක්‍ය පහක් ලියන්න.

(ආ) ඉහත චිත්‍රයට අදාළව නාමපද පහක් හඳුනාගෙන ඒවායේ ඒක වචන රූප සහ බහු වචන රූප ලියා දක්වන්න.

4. පහත දී ඇති යෙදුම්වලින් වාක්‍ය සාදන්න

| | |
|---|---|
| දීපවාලි උත්සවේ | ලියනවා |
| නිවාඩු කාලෙ | කතා කරනවා |
| හොඳම යාලුවා | නටනවා |
| අපේ කාර් එක | සෙල්ලම් කෙරුවා |
| කෝවිල | ඇඳුවා |

5. ඔබ පොතක් මිලට ගැනීමට සාප්පුවකට ගියේ යැයි සිතන්න. එහිදී ඔබත් වෙළෙන්දාත් අතර ඇති විය හැකි කතාබහ වාක්‍ය දහයකින් ලියා දක්වන්න.

6.





(අ) ඉහත දැක්වෙන එක් එක් රූපය සඳහා ඊට ගැළපෙන වර්තමාන කාල වාක්‍යය බැගින් ලියන්න.

(ආ) ඉහත ඔබ ලියූ වාක්‍ය පහ අතීත කාලයට හරවන්න.

7. පහත දැක්වෙන වාක්‍ය දෙමළ බසින් ලියන්න.

i. මම දැන් සිංහල ඉගෙන ගන්නවා.

ii. මාමලා හෙට අපේ ගෙදර එනවා.

iii. මගේ අක්කාගෙ නම දීපා.

iv. හුඟ දවසකින් වැස්සෙ නෑ.

v. මම තාම දවල්ට කෑවෙ නෑ.

vi. ගීතා ඊයෙ ලස්සන සාරියක් ගත්තා.

vii. අපේ පන්තියෙ ගුරුතුමිය හරි හොඳයි.

viii. මේ සැරේ විභාගය මට අමාරුයි.

ix. එයාලා අලුත් ගෙයක් හදනවා.

x. අපි අද හවස කෝවිලට යනවා.

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 15 බැගිනි.)